# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
# முதியோர்களுக்கான தேசிய செயலகம்
# National Secretariat for Elders

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment


*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා* -செயலூக்கமான முதுமையை நோக்கி - *Towards an active ageing*

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>**My No.** | NSE/DEV/08/ESSF/08 | ඔබේ අංකය<br>உமது இல.<br>**Your No.** | | දිනය<br>திகதி<br>**Date** | 2024.01. |

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
.........................................

<u>වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම වෙනුවෙන් අලුත්වැඩියාව හා උපකරණ ලබා දීම - 2024</u>

ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වැඩිහිටි උවටැන් නිවාස ප්‍රමිතියට (1506:2015) අනුකූලව පවත්වාගෙන යාම සඳහා එහි පවතින අඩුපාඩු සහ විවිධ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට ඉහත වැඩසටහන මඟින් 2023 වර්ෂය තුළ වැඩිහිටි නිවාස 30 ක් වෙනුවෙන් එක් වැඩිහිටි නිවාසයකට රුපියල් මිලියන 02 ක උපරිමයකට යටත්ව ප්‍රමුඛතාවය මත ආධාර මුදල් ලබා දීමට වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව විසින් අනුමත කර ඇත.

02.ඒ අනුව උක්ත වැඩසටහනට අදාල උපදෙස් පත්‍රිකාව මේ සමඟම අමුණා ඇති අතර (ඇමුණුම 01), ඊට අනුකූලව සුදුසුකම් සපුරාලන වැඩිහිටි නිවාස (සැ.යු වැඩිහිටි නිවාස 02 කට වඩා සුදුසුකම් සපුරාලන විට අනුපිළිවෙලින් ඉදිරිපත් කල යුතුය) සිදු කල යුතු අළුත්වැඩියාවන් /උපකරණ ලබා ගැනීම් සම්බන්ධයෙන් මේ සමඟ අමුණා ඇති **NSE/DEV/08/ESSF/08** ආකෘති පත්‍රයට අනුව (ඇමුණුම 02) සම්පූර්ණ කර සහ ඊට අනුකූලව සකස් කරන ලද විධිමත් ඇස්තමේන්තුවද සමඟ 2024.05.01 වන දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

03.එසේම ඉහත වැඩසටහන යටතේ ආධාර මුදල් ලබා දෙන සෑම වැඩිහිටි නිවාසයක් සමඟ ගිවිසුම්ගත විය යුතු "දෙපාර්ශවයක් අතර ඇතිකර ගන්නා අවබෝධතා ගිවිසුම" (ඇමුණුම 04) සහ වැඩිහිටි නිවාසය පිහිටි ඉඩම රජයේ ඉඩමක් නොවන සෑම අවස්ථාවකදීම එම ඉඩම අයත් සංවිධානය /ආයතනය /පුද්ගලයා හෝ පුද්ගලයින් මේ සමඟ අමුණා ඇති "දෙපාර්ශවයක් අතර ඇතිකර ගන්නා එකඟතා ගිවිසුම" (ඇමුණුම 03) ද නිසි පරිදි අත්සන් කර මා වෙත යොමු කල යුතුයි.

04.එමෙන්ම මෙම කාර්යය කෙරෙහි ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර දිස්ත්‍රික්කය තුල පිහිටි මෙම ආධාරය ලබා දීමට වඩාත්ම සුදුසු වැඩිහිටි නිවාස තෝරා නියමිත දිනට පෙර යොමු කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් වැඩිදුරටත් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.ජී.ලැනරෝල්
අධ්‍යක්ෂ

පිටපත:-

දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී / දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී - ඉහත වැඩසටහනට අනුකූලව
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ......................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ
මට්ටමින් සුදුසුකම් සපුරන
වැඩිහිටි නිවාස තෝරා ගැනීමට


ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
**Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.**
**ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com**
**ෆැක්ස්/ பெக்ஸ் / Fax** : 0112187015

**දුරකථන / தொலைபேசி/ Telephone:**
**අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director** : 0112187045
**කාර්යාලය / அலுவலகம் / Office**
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
ගිණුම් අංශය : 0112054138

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>**My No.** | NSE/DEV/08/ESSF/08 | ඔබේ අංකය<br>உமது இல.<br>**Your No.** | | දිනය<br>திகதி<br>**Date** | 2024.01. |

අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සඳහා